# නත්තල් තෑගි ගෙන එන නත්තල් සීයගේ කතාව

නත්තල් උත්සවයට අදල ක්‍රිස්තුන් වහන්සේගේ උපතටත් වඩා නත්තල් ආශ්‍රිතව ලෝකය පුරාම මතුවන ප්‍රධාන නත්තල් සැරසිල්ල සුදු රැවිලක් ඇති රතු තොප්පියක් හා රතු ඇඳුමකින් සැරසුණ විශාල ගාන්චුවක් සහිත පලල් බඳ පටියක් බැඳ බූටිස් සපත්තු වලින් සැරසුන "නත්තල් සීයා" නම් චරිතයයි. ලෝකය පුරා මේ ජනප්‍රිය නිර්මාණය හඳුන්වන්නේ "සැන්ටා" යනුවෙනි.

සෑම නත්තල් උත්සවයකම "සැන්ටා" අවශ්‍යමය. උත්සවයේ කාටත් තෑගි පිරිනමන්නේ නත්තල් සීයාය. නත්තල් සීයා එනවිට ගායනා කරන්නට ලෝකය පුරාම ජනප්‍රිය වූ ගීයක් තිබේ. එකම උත්සව සංකල්පයක් ලොව පුරාම වසරක වූවා නම් එහි මූලික තැන "නත්තල් සීයාට" අනිවාර්යයෙන්ම හිමිය.

## නත්තල් සීයාගේ අදහස උපන්නේ කෙසේද?

සිව්වන ශතවර්යේ නූතන තුර්කීය ලෙස හඳුන්වන ප්‍රදේශයේ නිකලස් නම් බිෂොප්තුමෙකු වාසය කළා. මොහු කුඩා කාලයේ දෙමාපියන් විශාල ධනයක් මොහු වෙනුවෙන් ඉතිරි කර අකාලයේ මිය ගිය නිසා ඔහු ඉතා පොහොසත් තැනැත්තෙකු ලෙස සමාජය දැන සිටියා. ඉතාම කරුණාවන්ත හා හිත උණුවෙන තැනැත්තෙකු ලෙස පතලවූ මෙතුමා දුගී දුප්පතුන්ට ප්‍රසිද්ධියක් නොතකා කරුණාවෙන් උපකාර කළහ.

උන්වහන්සේ ජනයාට කළ උපකාර ගැන විවිධාකාරයේ ජනප්‍රවාද පවතිනවා.

## නත්තල් තෑගි දමන දිග මේස් බිහිවීම

නත්තල් තෑගි දමන්නට දිග මේස් කලාත්මකව විවිධාකාරව ලෝකය පුරාම නිර්මාණය වෙයි. මෙයද නිකලස් බිෂොප්තුමා නිසා සිදුවන බවයි කට කතාව.

මෙසමයේ එක්තරා නිවසක දුවරුන් තිදෙනෙකු සිටියා. මේ දූවරුන් දීග දෙන්නට දෙමාපියන්ට නොහැකි වුයේ දැවැද්ද දෙන්න ධනවත් නොවු නිසයි. මේ ගැන දැනගත් බිෂොප්තුමා හොර රහසේ මේ ගෙදර උණුසුම් කරන්ට භාවිතා කරන චිමිනිය අසලින් නිවස තුළට හොර රහසේ රන් කාසි දමන්නට පටන්ගෙන තිබෙනවා. මේ මුදල් ප්‍රයෝජනයට ගෙන ලොකු දුව දීග දෙන්නට හැකි උනා. කවුද මේ රන්කාසි ගෙට දුන්නේ කියලා තාත්තා හොර රහසේම විපරම් කරන්න පටන් ගත්තා. එක දවසක් රන් කාසි දමන බිෂොප් අතටම අහුඋනා. දරුවන් දීග දෙන්නට රහසිගතව උපකාර කිරීමට තමා උත්සහ කළ බව බිෂොප්තුමා පැවසුවා.

නොපෙන්නට දරුවන්ට නත්තල් ගහ යට තෑගි තබනනේ "නිකලස්" පූජකතුමා කියලයි සමාජයේ මතයක් ගොඩනැගුනේ. නිකලස් බිෂොප්තුමාගේ තෑගි බෙදන සංකල්පය රටින් රටට ව්‍යාප්තව ශාන්ත නිකලස් යන භාවිතය අවැමෙන් SAIT NICHOLAS වචනය SINTERKIAAS ලෙස භාවිතා කරන්න පටන් ගෙන th SANTA CLAHS "සැන්ටාක්ලොස්" ලෙස පරිනාමය වීය.

## කොකාකෝලා සමාගම නිර්මාණය කළ නූතන සැන්ටා

අප මේ සමයේ භාවිතා කරන නත්තල් සීයා ගේ චරිත ස්වභාවය නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවන්නේ ලෝක ප්‍රකට "කොකාකෝලා" සමාගමටයි. 1920 වර්ෂයේ කොකාකෝලා සමාගම නූතන නත්තල් සීයා කොකාකෝලා දැන්වීම සඳහා නිර්මාණය කළේය. යොදා ගත්තේය.

1930 චිත්‍ර ශිල්පී ප්‍රෙජ් මයිනස් විචින් නත්තල් සීයා කොකාකෝලා රස බලන චිත්‍රයක් විශාල වෙළඳ ආයතනයක් අසල ප්‍රදර්ශනය කිරීම එහි ව්‍යාප්තියේ ආරම්භය විය.

**කොකාකෝලා වෙළඳ දැන්විම් වල ඇති රතුපාට නත්තල් සීයාට උරුම වූයේ එලෙසින්ය.**







ආචාර්ය
**නිමල් සේදර**



## කවියෙන් කියන වග

බෝමැඩ විහාරය වෙත මල් සුවද ගෙන
ආගම දහම පිළිබද නොම හැදින ගෙන
වනසා දමන විට යන එන සියලූ තැන
දෙවියන් නොමැත මිනිසුන් පා තබන තැන

**වෙත්තසිංහ**